# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 14 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 ජුනි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 6.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2005 අංක 14 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 31 වන දින]

එල්. ඩී.–ඕ. 63/2004.

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2005 අංක 14 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 17 වන වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *1979 අංක 15 දරන පනතේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.*

> "(7) වන්දි නියම කිරීම මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් සිදු කරනු ලබන විට, එම වන්දි මුදල මහෙස්ත්‍රාත්වරයකු විසින් සාමාන්‍යයෙන් නියම කළ හැකි දඩ මුදලට වඩා වැඩි වුව ද, එය නොතකා, ඒ වන්දිය පීඩාවට පත් එක් එක් පාර්ශ්වකරුවකු වෙනුවෙන් රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "කෙළවල, මුත්‍රාවල, හිසකෙස්වල හෝ නියපොතුවල ආදර්ශයක්" යන වචන වෙනුවට "ලේ වල, කෙළවල, මුත්‍රාවල, හිසකෙස්වල හෝ නියපොතුවල ආදර්ශයක් " යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. *ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 126අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 126අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

"නොතැනියාව පිළිබඳ දැන්වීම. 126අ (1) මහාධිකරණයේ දී අධිචෝදනා මත නඩු විභාගයක් පවත්වන අතරතුර දී නොතැනියාව පිළිබඳ විත්ති වාචකයක් සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට-

(අ) විමර්ශනය අතරතුර දී තම ප්‍රකාශය සිදු කරන අවස්ථාවේදී නොතැනියාව පිළිබඳ විත්ති වාචකයක් ඇති බවට පොලිසියට ප්‍රකාශ කර ඇත්නම් මිස ; හෝ

2-P.L. 000104 - 4,500 (2005/02)

(ආ) මූලික පරීක්ෂණය සිදු කරමින් පවතින යම් කවර අවස්ථාවක දී හෝ එවැනි කරුණක් පොලිසියට ප්‍රකාශ කර ඇත්නම් මිස ; හෝ

(ඇ) අධිචෝදනා පත්‍රය භාර දීමෙන් පසු නඩු විභාගය ආරම්භ වීමේ දිනයට දින දහ හතරකට පෙර කවර අවස්ථාවක දී හෝ නීතිපතිවරයාට දැනුම්දීමක් සහිතව එවැනි විත්ති වාචකයක් මතුකර ඇත්නම් මිස,

කිසි ම තැනැත්තකුට හිමිකමක් නොතිබිය යුතු ය :

එසේ වුවද, ඉහත දක්වා ඇති කාලසීමාව ඇතුළත නොතැනියාව පිළිබඳ විත්තිවාචකය පළ කිරීමට තමා ප්‍රමාදවූයේ ඇයි ද යන්න පෙන්නුම් කිරීම සඳහා ප්‍රමාණවත් හේතු චූදිතයා විසින් ඉදිරිපත් කර ඇති බව අධිකරණයේ මතය වන්නේ නම්, නොතැනියාව පිළිබඳව විත්තිවාචකය ඉදිරිපත් කිරීම සඳහා ඉන්පසුව සහ පැමිණිල්ලේ නඩුව අවසන් වීමට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී අධිකරණය විසින් චූදිතයාට, අවසර දෙනු ලැබිය හැකි ය.

(2) එම තැනැත්තා සිටි බවට හිමිකම්පාන වේලාව සහ ස්ථානය පිළිබඳ සියලු තොරතුරු ද, එම තැනැත්තාගේ නොතැනියාව සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කරන තැනැත්තන් ඇත්නම්, එම තැනැත්තන් පිළිබඳ මුල් ප්‍රකාශයේ අන්තර්ගත විය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා "නොතැනියාව සනාථ කිරීම සඳහා සාක්ෂි" යන්නෙන් විත්තිකරු යම් වි ශේෂිත ස්ථානයක හෝ විශේෂිත ප්‍රදේශයක, විශේෂිත වේලාවක් තුළ දී සිටීමේ හේතුව නිසා චෝදනා කරනු ලබන වරද සිදු වූ අවස්ථාවේ දී වරද සිදු කරනු ලැබුවේ යයි කියනු ලබන ස්ථානයේ දී එම තැනැත්තා නොසිටි බවට හෝ සිටීමට ඉඩ නැති බවට පෙන්වීම සඳහා වන සාක්ෂි අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 147 වන වගන්තියේ "සහතික පිටපත් දෙකක්" යන වචන වෙනුවට "සහතික පිටපත් තුනක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 154 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) නැවත අංක යෙදූ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) මහාධිකරණය ඉදිරියේ නඩු විභාගය සඳහා චූදිතයා ඉදිරිපත් කිරීමෙන් පසු, මහාධිකරණයේ දී චූදිතයාට අධිචෝදනා කරනු ලැබුවහොත් වඩා අඩු වරදකට වරද පිළිගැනීමට තමා කැමති බව චූදිතයා විසින් ප්‍රකාශ කළ හැකි අතර, මහෙස්ත්‍රාත්වරයා විසින් එම ප්‍රකාශය වාර්තා ගත කළ යුතු ය :

එසේ වුවද, එවැනි ප්‍රකාශයක් කර තිබීමේ හේතුවෙන්, මහාධිකරණය ඉදිරියේ චූදිතයාගේ නඩු විභාගය පැවැත්වීම කිසිදු ආකාරයකින් වළක්වනු නොලැබිය යුතු ය.

එසේම තවදුරටත් එවැනි ප්‍රකාශයක් කර තිබීම, නඩු විභාගයේ දී චූදිතයාට කිසිදු ආකාරයකින් හානිකර නොවිය යුතු ය.

(3) මහාධිකරණයේ දී චූදිතයා වෙත අධි චෝදනා භාරදීමෙන් පසු, එම අධිචෝදනා මත තමා වරදකරු කරනු ලැබිය හැකිව තිබුනේ යම් අඩු වරදක් සඳහා ද එම අඩු වරදට වරදකරු බව පිළිගැනීමට තමා කැමති බව ප්‍රකාශ කරන අවස්ථාවක සහ එම වරද පිළිගැනීම භාරගැනීමට අධිකරණය කැමති වන අවස්ථාවක, වඩා අඩු වරදකට වරද පිළිගැනීමට චූදිතයා තුළ තිබුන කැමැත්ත ඔහු විසින් මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ප්‍රකාශ කර තිබූ බව, චූදිතයාට දඬුවම් පැමිණවීමේ දී විනිශ්චයකාරවරයා විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ චූදිතයා විසින් ප්‍රකාශයක් කර තිබීම මගින් මහාධිකරණයේ දී ගොනු කරනු ලැබූ අධිචෝදනා මත චූදිතයා වරදකරු කරනු ලැබිය හැකිව තිබූ යම් අඩු වරදක් සඳහා මහාධිකරණයේ දී චූදිතයා විසින් කරනු ලබන වරද පිළිගැනීමක් භාරගැනීමට අධිකරණය වෙත හෝ නීතිපතිවරයා වෙත යම් වගකීමක් පැවරෙන බවට කියවා තේරුම් නොගත යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 197 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 197 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වරදකරු බවට උත්තරවාද දීම සහ දණ්ඩන නියම කිරීම.

197. (1) (අ) චූදිතයාට අධිචෝදනා කරනු ලැබ ඇත්තේ යම් වරදක් සඳහා ද එම වරදට තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් ; හෝ

(ආ) එම අධිචෝදනා පත්‍රය මත ඔහු වරදකරු කරනු ලැබිය හැකි අඩු වරදක් සඳහා චූදිතයා තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් සහ එම උත්තරවාදය පිළිගැනීමට අධිකරණය සහ නීතිපතිවරයා කැමති වන්නේ නම්

සහ ඔහුගේ උත්තරවාදයේ ප්‍රතිඵලය ඔහු නිවැරදිව අවබෝධ කරගෙන ඇති බව විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන ආකාරයෙන් පෙනී යන්නේ නම් ඒ උත්තරවාදය අධිචෝදනා පත්‍රයෙහි වාර්තාගත කළ යුතු අතර, ඒ අනුව චූදිතයා වරදකරු කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, වරදකරු බවට උත්තරවාද දෙන ලද අධිචෝදනාව මිනීමැරුමක් සම්බන්ධයෙන් වූ වරදක් වන විට, ඒ උත්තරවාදය පිළිගැනීම විනිශ්චයකාරවරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි අතර, තමා වරදකරු නොවේ යයි චූදිතයා විසින් උත්තරවාද දෙන ලද්දාක් මෙන් ඒ නඩුවිභාගය පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) විනිශ්චයකාරවරයා විසින් චූදිතයාට දණ්ඩන නියමයක් පැනවීමේ දී චූදිතයා එසේ උත්තරවාද දී ඇති බව සැලකිල්ලට ගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 205 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 205 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වරදකරු බවට උත්තරවාද දීම සහ දණ්ඩන නියම කිරීම සම්බන්ධයෙන් 197 වන වගන්තිය අදාළ වන බව.

205. චූදිතයාට අධිචෝදනා කරනු ලැබුවේ යම් වරදක් සඳහා ද එම වරද සඳහා හෝ අධිචෝදනාව මත ඔහු වරදකරු කරනු ලැබිය හැකි අඩු වරදක් සඳහා චූදිතයා තමා වරදකරු යයි උත්තරවාද දෙන්නේ නම් 197 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.".

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 263 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ඔහුගේම බැඳුම් ඔප්පුවක් මත නැතහොත් ඇපකරුවන්ගේ ඇප පිට ඔහු මුදා හැරීම හෝ අධිකරණය විසින් කළ හැකි ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 263 වන වගන්තිය සංශෝධනය කිරීම.

"ඔහුගේ ම බැඳුම් ඔප්පුවක් මත නැතහොත් ඇපකරුවන්ගේ ඇප පිට ඔහු මුදා හැරීම හෝ අධිකරණය විසින් කළ හැකි ය:

එසේ ම තවදුරටත් ජූරි සභාවක් සහිතව හෝ ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයේ දී පවත්වනු ලබන සෑම නඩු විභාගයක් ම, ප්‍රායෝගිකව සිදු කළ හැකිතාක් දුරට, දිනපතා පැවැත්විය යුතු ය.".

**10**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.